**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2010**

----------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2010 දෙසැම්බර් 31 දිනට පාර්තෝෂික සඳහා වෙන් කිරීම් රු.90,045 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 261(3) | 2010 පෙබරවාරි මාසයේද මුදල් පොතේ ශේෂය ඉක්මවා රු. 338,341 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 මගින් හඳුන්වා දී ඇති යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ අත්පොත | |

| | |
|---|---|
| (i) 5 වන පරිච්ඡේදයේ 5.1 සහ 5.12 ඡේද | ආවරණය වන කාලසීමාව නොදක්වා සංයුක්ත සැලැස්මක් පිළියල කර තිබුණු අතර, ආයතනය සතු වර්තමාන සම්පත්, සංවිධාන ව්‍යුහය, පසුගිය වසර 3 ක මෙහෙයුම් සමාලෝචනය, සැලසුම් කරන ලද කාල සීමාව තුල ආයතනයේ අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීම සඳහා කළමනාකරුවන්ගේ වගකීම සහ කාර්යසාධන නිර්නායක එහි දක්වා නොතිබුණි. |
| (ii) 07 වන පරිච්ඡේදයේ 7.4.5 උප ඡේදය | පසුගිය වර්ෂවල මෙන්ම 2010 වර්ෂය සඳහාද මණ්ඩලය සතු ස්ථාවර වත්කම් සහ ගබඩා පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා මණ්ඩලය විසින් සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අයිතමය | සමාලෝචිත වර්ෂය | පසුගිය වර්ෂය | පසුගිය වර්ෂය හා සැසඳීමේදී වාසිදායක(අවාසිදායක) ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| රජයේ ප්‍රදාන | 31,508,960 | 22,727,524 | 38.64 |
| මුළු පුනරාවර්තන වියදම බදු හැර | 29,756,776 | 24,051,645 | (23.72) |

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්යසාධනය

**(අ)** නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ (එස්බීඊ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සම්බන්ධ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යයක් වුවද, දැනට පවත්නා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ ප්‍රමාණය හෝ ඒවායේ තොරතුරු යාවත්කාලීන වන දත්ත පද්ධතියක් සකසා ගැනීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ii) හඳුනා ගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ වාර්ෂිකව සමාලෝචනයට භාජනය කරනු ලබන මූල්‍ය පකාශනවල සාමාන්‍ය 20% කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(iii) සමාලෝචනයට භාජනය කරන ලද අදාල මූල්‍ය ප්‍රකාශන අතුරින් සුවිශේෂ/වැදගත් (Significant) නිරීක්ෂණ සහිත මූල්‍ය ප්‍රකාශන දෙකක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ හඳුනා ගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂය සහ 2009 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම පිළිබඳ තත්ත්වය පසුගිය වර්ෂය හා සසඳා පහත දැක් වේ.

| | වර්ෂය | |
|---|---|---|
| | **2010** | **2009** |
| ජනවාරි 01 දිනට සමාලෝචනය කිරීමට/නිම කිරීමට ඇති වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 802 | 775 |
| වර්ෂය තුළ ලැබුණු වාර්ෂික වාර්තා සංඛ්‍යාව (පෙර වර්ෂවල ලැබූ වාර්තා හැර) | 1109 | 937 |
| | -------- | ------- |
| | 1911 | 1712 |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ නොවන වාර්ෂික වාර්තා සංඛ්‍යාව | (27) | (6) |
| කාලය ඉකුත් වූ වාර්ෂික වාර්තා සංඛ්‍යාව | (735) | (738) |
| එකම වාර්ෂික වාර්තාව දෙවරක් ලැබීම | (13) | (10) |
| | ------- | ------ |
| | 1136 | 958 |
| සමාලෝචනය නිම කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව | (211) | (156) |
| | -------- | -------- |
| දෙසැම්බර් 31 දිනට සමාලෝචනය කළයුතු/ නිම කළයුතු වාර්ෂික වාර්තා සංඛ්‍යාව | 925 | 802 |
| | ==== | ==== |

**“මෙම ප්‍රකාශයේ දැක්වෙන පදනම් මත නොව අවදානම් පදනම් කරගත් නියැදි මත සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගන්නා බැවින් මෙම ප්‍රකාශය තවදුරටත් අදාල නොවන බව”** අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා ඇත.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සඳහා ඉහළ වැටුපක් ගෙවා විශේෂිත සුදුසුකම් සහිත නිලධාරීන් තාක්ෂණ කළමනාකරු තනතුරු සඳහා බඳවා ගෙන තිබුණු අතර, මේ අය අතුරින් එක් නිලධාරියෙකුට මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන කටයුතු පිළිබඳ වගකීම පවරා තිබුණි.

**“මණ්ඩලයේ ආදායම රජයේ ප්‍රදානයෙන් පමණක් සමන්විත වන බැවින් සහ පුනරාවර්තන වියදම රු. මි.30 කට පමණ ආසන්න බැවින් පූර්ණ කාලීනව මූල්‍ය සහ පරිපාලන කළමනාකරුවෙකු පත්කිරීම සාධාරණ නොවන බව”** අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා ඇත.

2.2.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

2010 වර්ෂය තුළ නිලධාරීන් සිව් දෙනෙකු අවස්ථා 07 කදී විදේශ ගමන් සඳහා සහභාගී වී තිබු අතර මණ්ඩලය ඒ වෙනුවෙන් රු. 1,893,393 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ තාක්ෂණ නිලධාරීන් පමණක් විදේශ ගමන් සඳහා සහභාගී වී තිබුණි. මෙම විදේශ සංචාරවලට අදාලව විද්‍යුත් තැපෑලෙන් ලබා ගත් තොරතුරු කිහිපයක් හැරෙන්නට විධිමත් ආරාධනා පත්‍ර හෝ සංචාර වල සවිස්තර තොරතුරු හෝ ඉදිරිපත් කර නොතිබුණි. සංචාර සඳහා අනුග්‍රහ දක්වන පාර්ශ්වයන් විසින් දරනු ලබන හෝ ප්‍රතිපූර්ණය කරනු ලබන වියදම් හෝ මොනවාද යන්න පිළිබඳ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**“වර්තමානයේ ජාත්‍යන්තර ආයතන සියළුම සන්නිවේදන මෙහෙයුම් මට්ටම් විද්‍යුත් ක්‍රම දක්වා වැඩිදියුණු කර ඇති බැවින්, පූර්ව විද්‍යුත් කාලපරිච්ඡේදයේ භාවිතා කළ ආකාරයට ලිපිලේඛන බලාපොරොත්තු වීම උචිත නොවේ”** යනුවෙන් අධ්‍යක්ෂ ජනරාල් සඳහන් කර තිබුණද දක්වා ඇති කරුණු සනාථ කර ගැනීමට සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොවීය.

(ආ) 2009 සැප්තැම්බර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටුවා ඇති නිලධාරීන් දෙදෙනා, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 3.2 වගන්තියට පටහැනිව 2009 සහ 2010 වර්ෂ වල විදේශ සංචාරයන් සඳහා සහභාගී කර තිබුණි.

2.2.3 **ආර්ථික නොවූ ගනුදෙනු**

මාසිකව රු. 372,375 ක (ව.අ. 4965 x රු.75) බදු කුලියක් සහ රු.15,000 ක උපරිමයකට යටත්ව සේවා ගාස්තුවක් ගෙවමින් බාහිර පාර්ශවයකට අයත් ගොඩනැගිල්ලක මණ්ඩලය පවත්වා ගෙන ගොස් තිබුණි. දස දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව බදු කුලිය සහ සේවා ගාස්තු (එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු සහිත ) එකතුව පිළිවෙලින් රු.5,154,862 ක් සහ රු.137,169 ක මුදලක් වැය කර තිබුණි. මේ අනුව එක් සේවකයෙකු වෙනුවෙන් බදු කුලිය සහ සේවා ගාස්තු ලෙස වර්ෂයකට රු.529,202 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේ වුව ද ආර්ථිකමය වශයෙන් වාසිදායක විකල්ප ස්ථානයක් තෝරා ගැනීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමු කර නොතිබුණි.

2.2.4 **කාර්ය මණ්ඩල පිරිවැය - පාර්තෝෂික දීමනා ගෙවීම**

අධ්‍යක්ෂ ජනරාල් සහ තාක්ෂණික කළමනාකාරිණිය මණ්ඩලයට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඔවුන් බඳවා ගත් දින සිට පාර්තෝෂික දීමනා සඳහා වෙන් කිරීම් කර තිබුණි. අධ්‍යක්ෂ ජනරාල් සහ තාක්ෂණික කළමනාකාරිණිය සඳහා පිළිවෙලින් රු.1,583,333 ක් සහ රු.735,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට පාර්තෝෂික දීමනා සඳහා වෙන් කිරීම් කර තිබුණද අදාල නිලධාරීන්ට පාර්තෝෂික දීමනා වෙන් කිරීම් සඳහා නෛතික ප්‍රතිපාදනයන් නොතිබුණි.

**"කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන්නන් වෙනුවෙන් පාර්තෝෂික සඳහා වෙන් කිරීම් කළ යුතු බවට අභියාචනාධිකරණයේ තීරණය කරන ලද නඩු තීන්දු පවතින බව"** අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණු නමුත් මෙම කොන්ත්‍රාත් තනතුරු ඇති කිරීම හා පාර්තෝෂික වෙන් කිරීම කළ හැකි බවට වූ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) මුදල් සහ මූල්‍ය
(ආ) භාණ්ඩ සමීක්ෂණ
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඇ) සංයුක්ත සැලස්ම හා ක්‍රියාකාර සැලැස්ම